# ප්‍රසන්න

## මෙල්බන් ගුවන්විදුලියේ ප්‍රසන්න හඬ





## මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**

1986 වර්ෂයේ දී රත්මලාන කම්කරු සෙවණේ දී වතු කම්කරුවන් වෙනුවෙන් උත්සවයක් පැවැත්තුවා. එහිදී ඇන්ටන් ජූඩ්, සරත් චන්ද්‍රසිරි, ජගත් චන්ද්‍රසිරි සමග මා කෙටි නාට්‍යයක් ඉදිරිපත් කළා. එම උත්සවය ඡායාරූපගත කරන්නට තරුණ ඡායාරූප ශිල්පියෙක් ඇවිත් හිටියා. ඔහු අප සමග කුළුපග වුණා. වතු කම්කරු සංගමයේ නිල ඡායාරූප ශිල්පියා. ඔහු නමින් ප්‍රසන්න නාමල් කුරුකුලරත්න. ඔහු ගත් ඡායාරූප කීපයක් පසුව අපට ලැබුණා. එම ඡායාරූප තවමත් මාළඟ තිබෙනවා. ඊට පස්සෙ එම ඡායාරූප ශිල්පියා මට හමුවුණේ ඔස්ට්‍රේලියාවේදී ප්‍රසංග වේදිකාවක නිවේදන කටයුතු කරන අතරදී.

**ශ්‍රීනාත්**
ඉතින් ප්‍රසන්න කොහොමද?
**ප්‍රසන්න**
ඔහේ ඉන්නවා ශ්‍රීනාත්.. උදේට පොදු වැඩ මොනවා හරි කරනවා.. හවසට වැඩට යනවා.. ගෙදර එනකොට රෑ එකොළහ දොළහ වෙනවා..

**ශ්‍රීනාත්**
එහෙම තමයි ඉතින් .. හමෝම කාර්ය බහුලයි.. නමුත් පුද්ගලික වැඩ වලට වඩා පොදු වැඩ වලට උරදෙන ඔයගොල්ලො වගේ අය විශේෂයි..කොහොමද පාසල් ජීවිතේ..?

**ප්‍රසන්න**
මට පාස්ල තුනකට යන්න වාසනාව උදාවුණ කෙනෙක්.. මුල්ම පාසල ගලේවෙල කනිෂ්ඨ විද්‍යාලය.. ඊළඟට අහංගම සාරිපුත්‍ර... පාසල් කාලය අවසන් කළේ තර්ස්ටන් විදුහලෙන්.. තර්ස්ටන් වි්‍යාලයට එන්න පුලුවන් වුණේ පහේ ශිෂ්‍යත්වය පාස් වුණ නිසයි..

**ශ්‍රීනාත්**
මේ වගේම සමිති සමාගම් වැඩ ඒ කාලෙත් කලා ද?
**ප්‍රසන්න**
ඒක මං හිතන්නෙ පෙර පුරුද්ද කියලා.. මම පාසලේ තිබුණ බොහෝම සංගම් වල නිල තල දැරුවා.. සාහිත්‍ය සංගමයේ, කලා සංගමයේ, සෞඛ්‍යදාන සංගමයේ, ඡායාරූප සංගමයේ, විවාද කණ්ඩායමේ..

**ශ්‍රීනාත්**
නිවේදක කටයුතු පටන් ගන්න ඇත්තෙ ඉස්කෝලෙදි වෙන්න ඇති.
**ප්‍රසන්න**
ඔව්.. 1975 තර්ස්ටන් කලා උළෙලේදි මම මුලින්ම නිවේදන කටයුතු කලා... ඊට පස්සෙ හැම අවුරුද්දකම සුලු සුලු වශයෙන් නිවේදන කටයුතු කලා... 1981 වර්ෂය මට ඉතාම වැදගත්.. ඒ වර්ෂයේ කලා උළෙලේ නිවේදන කටයුතු කලේ මම.. මෙම කලා උළෙලේ ප්‍රධාන අමුත්තා ලෙස පැමිණි ගුවන් විදුලි සංස්ථාවේ සිංහල සේවා අධ්‍යක්ෂ චිත්‍රානන්ද අබේසේකර මහතා ගුවන් විදුලියට ඇවිත් ඔහු හමුවෙන්න කිව්වා.. මම ඔහු හමුවෙන්න ගියා.. ඊට පස්සෙ ඔහු මාව ගුවන්විදුලි වැඩසටහන් වලට යොමු කළා.. මේ අවස්ථාවේ ඉතා ගෞරවයෙන් ඒ මහතා සිහිපත් කළ යුතුයි... නමුත් ගුවන් විදුලියට ගිය පමණික් වැඩ සටහන් වලට සහභාගිවෙන්න අවස්ථාව ලැබුණෙ නැහැ.. සෑහෙන කාලයක් බලා ඉන්න සිදුවුණා.. මට මුලින්ම සම්බන්ධ වෙන්න ලැබුණෙ ආරියරත්න විතාන මහත්තයා කළ සොඳුරු සෙවන වැඩසටහනටයි.. මේ වෙනකොට උසස් පෙළ කටළඟ'ටම ඇවිත්.. ගුවන් විදුලි වැඩ සටහන් පැත්තක තියලා පාඩම් වැඩ වලට වැඩිය් වෙහෙසෙන්න සිදුවුණා..

**ශ්‍රීනාත්**
වාණිජ අංශයෙන් ඉගෙනගෙන ඇයි කාර්මික වි්‍යාලයට ඇතුල්වුණේ?
**ප්‍රසන්න**
ඒකෙ කිසි අමුත්තක් නැහැ.. මම අපොස සාමාන්‍ය පෙළට මෝටර් කාර්මික වි්‍යාව ඉගෙනගත්තා.. ඒ එක්කම ඒ කාලෙ සීටීබී එකේ වැඩ කළ අපේ මාමා කෙනෙකුත් කාර්මික වි්‍යාලයට ඇතුලවෙන්න මාව උනන්දු කළා. විභාව විද්‍යාලයට යනවට වඩා කාර්මික වි්‍යාලයට යන එක හොඳ බව හැමෝගෙම මතය වුණා.. මම කාර්මි වි්ලයේ කලා වැඩසටහන් වලට උද්යෝගිමත්ව ඉිදිරිපත් වුණා. ඒකෙ බෑන්ඩ් කන්ඩායමෙත් හිටියා...
**ශ්‍රීනාත්**
ඔස්ට්‍රේලියාවට ආවෙ?
**ප්‍රසන්න**
1991... මම ඔස්ට්‍රේලියාවට එනකොට ගෙනාවා මම එකතු කරපු ගීත කැසට් 180ක පෙට්ටියක්.. ඒ කැසට් තාම මාළඟ තියෙනවා.. 1992 මම ඇඩිලේඩ් වලටයි ආවෙ.. එහෙ සිංහල සංගමය රේඩියෝ එකක් පටන් ගන්න කටයුතු කළා..ීඇඹ රේඩියෝ එක පටන් ගත්තෙ ඒ කාලෙ.. නමුත් මට ඒකට ඉන්න බැරි වුණා.. මම ආපහු මෙල්බන් වලට ආවා.. ඒ අය තාමත් ඒ රේඩියෝ එක කරනවා..

**ශ්‍රීනාත්**
මෙහේ රේඩියෝ එකට සම්බන්ධ වුණේ?
**ප්‍රසන්න**
1994 3''' රේඩියෝවට සම්බන්ධ වෙන් හැකි වුණා.. එතනට මාව යොමු කළේ ආනන්ද කුමාරසිරි මහතා යි... ඊට පස්සෙ බන්දු දිසානායක, උපා උපදාස, එල් බී ඒකනායක, සෑම් වීරරත්න, තව හුඟක් අය මට උදව් කළා.. 1994 ඉඳන් අවුරුදු හය හතක් හැකි පමණ ගුවන් විදුලියට සම්බන්ධ වුණා..

**ශ්‍රීනාත්**
ඡායාරූප කලාව අමතක කලා ද?
**ප්‍රසන්න**
නෑ..ඒකත් ටික ටික කරනවා.. නමුත් ඒකට දැන් ඒ හැටි වෙලාවක් නැහැ.. මම කතෝලික සිනමා පර්ෂදයේ ඇන්ඩ්‍රූ ජයමාන්න මහතා යටතේ වීඩියෝ පාඨමාලාවත් හැදෑරුවා.. මට ඉස්සෙල්ලම වීඩියෝ කැමරාවක් අල්ලන් දුන්නේ සුනිල් වීරසූරිය මහතා යි. ඒ ගැනත් ගෞරවයෙන් මතක් කරන්න ඕනෙ.. ඔහු.ත් දැන් පදිංචිව ඉන්නෙ ඔස්ට්‍රේලියාවෙ.. අවුරුදු 5ක් මම වතු කම්කරු සංගමයේ නිල ඡායාරූප ශිල්පියා ලෙස වැඩ කලා...

**ශ්‍රීනාත්**
මුලින්ම නිවේදන කටයුතු කලේ?
**ප්‍රසන්න**
මුලින්ම කළේ ගිම්හාන රංගන ප්‍රසංගය... ඊට පස්සෙ සනත් නන්දසිරි මහත්තයා මෙහේ ආව වෙලාවෙ දෙවෙනි දර්ශණයේ මම නිවේදන කටයුතු කළා. මට ඒකට උදව් කළේ අරවින්ද රූපසිංහ මහතා යි.. මා සිත්ගත් ප්‍රසංගය තමයි සුනිල් එදිරිසිංහ මහතාගේ නිම්තෙරක් ප්‍රසංගය..

**ශ්‍රීනාත්**
නාට්‍ය වලටත් සම්බන්ධ වුණා නේද?
**ප්‍රසන්න**
ඔව් ශ්‍රීනාත්.. මගේ එක හීනයක් සැබෑ වුණා ඔස්ට්‍රේලියාවෙදි.. ඒ තමයි මට මනමේ නාට්‍යයට සම්බන්ධ වේන අවස්ථාව ලැබීම.. මෙල්බන් හිදී කෙරුණ දර්ශණයේදි .. ඔට මේකට උදව් කළේ ජය ශ්‍රී චන්ද්‍රජිත් මහතාත් මාලිනී ජයසිංහ මහත්මියත් ශ්‍යාමොන් ජයසිංහ මහතාගේත් මග පෙන්වීම යටතේයි..

**ශ්‍රීනාත්**
බැලුවහම ඔබ ක්ෂෙත්‍ර කීපයකම වැඩ කළ කෙනෙක්..
**ප්‍රසන්න**
ඔව් ශ්‍රීනාත්.. හැම දෙයක්ම පොඩ්ඩ පොඩ්ඩ..

**ශ්‍රීනාත්**
පවුලේ විස්තර ටිකක් කියමුද?
**ප්‍රසන්න**
අම්මා තාත්තා ඉන්නවා.. නංගී මල්ලී... මේ අය සේරම ලංකාවෙ බොහොම සතුටෙන් ජීවත් වෙනවා..

**ශ්‍රීනාත්**
කලා කටයුතු වලට ගෙදර සහයෝගය කොහොමද?
**ප්‍රසන්න**
මගේ බිරිඳ සේනානි කුරුකුලරත්න, ජනනි පංකජ, කවිනි පබෝදා දුවලා සොනානි වෘත්තියෙන් නීතිඥවරියක වුවත් මගේ කලා වැඩ වලට පූර්ණ සහය ලබා දෙනවා.. ඒ වගේම මගේ හොඳම විවේචකයාත් ඇයයි.. මගේ වැරැද්දක් තිබ්බොත් පොල්ලෙන් ගැහුවා වගේ කියනවා... හොඳක් තිබ්බත් ඒ වගේම කියනවා..

**ශ්‍රීනාත්**
උදව් කළ අය ගැන කියමුද?
**ප්‍රසන්න**
හුඟාක් අය ඉන්නවා.. නම් අමතක වුණාට අමනාප වෙන්න එපා.. මුලින්ම සඳහන් කළ සියලු දෙනාත් තිස්ස කොලාවල, පරාක්‍රම රණවීර, ලාල් හෑගොඩ, කරුණාරත්න අබේසේකර, යන මහත්වරුන් මගේ ඉදිරි ගමනට බොහෝ අත හිත දුන්නා.. ඒ සියලු දෙනාම මේ වෙලාවෙ ගෞරවයෙන් මතක් කරනවා..

කස්තිරම 7 වන පිටෙන්

යුතුයි බොහෝදෙනා තමන්ගේ දරුවා ඇහැවාගේ ආරක්‍ෂා කරන්නේ. සමහර දෙමාපියෝ දරුවන් යම් යම් පුද්ගලයන්ගේ ඇහැ ගැහෙන්නට නොදී පරිස්සම් කරති. ඔවුන්ගේ ඇස් වහෙන් බේරා ගන්නටය. කොයිතරම් ආරස්සා කළත් වෙලාවකට අපේ ම ඇහේ තියෙන පොල් පරාලය අපට ම පෙනෙන්නේ නැත. අනුන්ගේ ඇහේ නම් යම්තම් කුණක් තිබුණත් යස අගේට පෙනෙන්නේය.

නාසය ද හුස්ම ගැනීමට - ගඳ සුවඳ දැන ගැනීමට වඩා තවත් දේට ප්‍රයෝජනවත් ය. එකක් අතින් ඇල්ලීම ය. එක එල්ලේම නාසය වෙතට නොව, ඔළුව වටේ අත යවා ඇල්ලීමේ විශේෂ ක්‍රමයක් ද අපි පුරුදු කරමු. ඉඳහිට ලා අපි මූණ එක්ක තරහ වෙලා නාසය කපා ගන්නෙමු. අපේ නාසය විද ගන්නට බලන අමාරුකාරයෝ ඉඳහිට වුව දක්නට ඇත. නාහෙට අහන්නේ නැති කෙනකු ආම්බන් කර ගන්නට වූ විට අපට ද එසේ කරන්නට සිතෙන්නේය. නාහෙට උඩින් වතුර ගලන අවස්ථාවලට මුහුණදුන් විට කොයිතරම් ගලන වතුරකට වුවද ඔරොත්තු දීම ප්‍රශ්නයක් නොවේ.
දිවට දිව ගාලා පොරොන්දු වෙච්ච අයත් සමහර විට වෙන් වන්නෝය. අනෙක් අතට දිව බොරු කීමට බාධාවක් ද වෙයි. කටට වුවමනා බොරුව කියන්නට දිව එකඟ නොවන නිසාය. බොරුවක් පමණක් නොව වෙනත් දෙයක් වුවද කියන්නට බැරිකමට දිව විකාගෙන සිටින තැන් ඇත. දිව දික් කරගෙන සිටින්නේ නම් ලොකු බලාපොරොත්තුවකින් ය.

යකා දත් හිටවපු කතාව ගම්මුන්ට පුරුදු එකක්. පුළුටු කාලා පැලට ගිය මනුස්සයා යකා එක එක ගලවා අතට ගත්තු දත්ටික පිළිවෙළකට හිටුවන තෙක් ඉස්පාසුවක් නැත. ඒ නිසාම ඔහුගේ කට ඉස්සරවීමෙන් සිදු වූයේ අතින් ගත් දත් ටික මූණාට දමා ගසා යකා යන්නට යාමය. යකා විසින් හිටවන ලද දත් සහිත උදවිය ඉඳහිට දකින්නට ලැබෙති. බොල්ලෑවා යනුවෙන් හැඳින්වෙන එබන්දකු මිය ගියත් දුටු අය විශ්වාස නොකරති. තවමත් සිනාසෙන සැටියක් පෙනෙන නිසාය. මෙහෙම කියන්නේ නම් බොල්ලෑවන් ගැන නොවේ. ලෝක අමාරුකාරයින් ගැනය.
කම්මුලට අත ළං කිරීමේ ක්‍රම දෙකක් ඇත. එකක් අපේම අත කම්මුලට තබා ගැනීමය. එය අපගේ හිතේ එක්තරා ගතියක් කියා පාන්නකි. තවත් කෙනකු කම්මුල අත ගාන්නේ වෙනත් අදහසකිනි. හොඳකට නොවේ. කම්මුල අත ගෑමට වඩා ඉඳුරාම වෙනස් දෙයකි. නිකට පෑම, නිකට පාන්නේ එසේ මෙසේ සතෙක් නොවේ, එළුවාය. රැවුල බා ගන්නට හිතන විටය. එළුවා නිකට පාන්නේ නිවට ඇම්බැට්ටයාට ය.

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මීයුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ